// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2323/07 – 2023 මාර්තු මස 13 වැනි සඳුදා – 2023.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2017/151.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.07.05 දිනැති හා අංක 2130/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.02 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් සූරියවැව, ගල්වැව හන්දිය, අංක 3586 හි පදිංචි කේ.එච්.රේමන් සුජීව මයා සහ හම්බන්තොට, මිරිජ්ජවිල, අඩි 100 පාරේ පිහිටි චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

කේ.එම්. රේමන් සුජීව,
අංක 3586, ගල්වැව හන්දිය,
සූරියවැව.

*පළමු පාර්ශ්වය*

නඩු අංකයඃ A 67/ 2019.
1R /COM/01/2017/151.

සහ

චයිනා හාබර් ඉංජිනියරින් කම්පැණි ලිමිටඩ්,
අඩි 100 පාර, මිරිජ්ජවිල,
හම්බන්තොට.

*දෙවැනි පාර්ශ්වය*

*අතර ඇති කාර්මික ආරවුල*

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් වන මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු ආර්.එස්. ආරියප්පෙරුම වන මා පත්කොට මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීමට පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ,

"චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් හි රියදුරෙකු ලෙස සේවය කල කේ.එච්. රේමන් සුජීව මහතාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදී විනය කරුණු මත ඔහුගේ සේවය අවසන් කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරනයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ"

පළමු හා දෙවන පාර්ශ්වයන්ටත් දෙවන පාර්ශ්වයට පළමු පාර්ශයටත් ප්‍රකාශයක් හුවමාරු කර ගත් පසු 2019.11.07 වැනි දින නඩුව විභාගයට ගත් අවස්ථාවේ ඉල්ලුම්කරු නීතිඥ සහය ලබාගැනීම සඳහා දින පතයි. 2020.01.20 වැනි දින ඉල්ලුම්කරුගේ නියෝජිතයකු නඩුවට සහභාගි නොවීය. 2020.02.06 දින ද ඉල්ලුම්කරු පැමිණ නැත . ලියාපදංචි තැපැලෙන් ඊළඟ නඩු දිනය 2020.03.10 බව දන්වා සිටි බැවින් හා එදිනට නොපැමිණියහොත් ඒක පාර්ශවීයව නඩුව විභාග කර අවසන් කිරීමට සිදුවන බව දන්වා ඇත. පැමිණිලිකරු නොපැමිණි බැවින් ඔහු නොමැතිව වග උත්තරකාර පක්ෂයෙන් සාක්ෂි කැඳවන ලදී. පැමිණිලිකරු අවස්ථා 3 ක දී ම නොපැමිණිමත් දෙන ලද සාක්ෂියත් පදනම් කර, නඩුව නිෂ්ප්‍රභාකර අවසන් කරන ලදි. එහෙත් පරිපාලනමය අතපසු වීම නිසා කොරෝනා සමයේ නතර කර තිබූ සියලු නඩු සඳහා කැඳවීම් ලිපි කාර්යාලයෙන් යැවීමේ දී මෙම නඩුවද 2020.08.14 වැනි දින කැඳවා ඇත. එදින නඩුව පිළිබඳ වර්තමාන තත්ත්වය පිළිබඳව 2020.08.21 වැනි දින ලිපියෙන් දන්වා තිබියදී නැවතත් 2021.02.02 දින ලිපියකින් පැමිණිලිකරුටද 2021.02.25 දින නඩුව සඳහා පැමිණෙන ලෙස දන්වා ඇත. ඒ අනුව ඉල්ලුම්කරු පැමිණ කියා සිටින්නේ කොරෝනා සමයේ හම්බන්තොට සිට පැමිණිමට තිබූ අපහසුතාවයන් ආර්ථික දුෂ්කරතාවන් හේතුකර අධිකරණයට නොපැමිණියා, විනා නඩුවේ අවශ්‍යතාවයක් නැතිකම නොවන බවයි.

පැමිණිලිකරු දන්වන කරුණු සැලකිල්ලට ගෙන වගඋත්තරකාර පාර්ශ්වයට විරුද්ධව දිවුරුම් ප්‍රකාශයක් මගින් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන ලද්දේ ප්‍රදානයට ගොනුව ඉදිරිපත් කර නොමැති බැවින් හා ඒ වන විට ගැසට් පතට තීරණය නොයවා තිබීමත්, පරිපාලනමය අතපසුවීමත්, ඉල්ලුම්කරුට සාධාරණ යුක්තිය ඉටුවීම සඳහාත්ය. ඒ අනුව 2021.03.15 වැනි දින හෝ ඊට පෙර දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ නම් 2021.03.31 වැනි දිනට දෙපාර්ශ්වය කැඳවන ලෙස නියම කරන ලදි. එදින පැමිණිලිකරු

නීතිඥවරියකගේ නියෝජනය සමග පැමිණ කරුණු ඉදිරිපත් කිරීම අනුව 2021.04.27 දිනට දෙපාර්ශවයම කැඳවන ලදී. රටේ පැවති තත්ත්වය මත 2021.06.25, 2022.03.02, 2022.03.18, 2022.05.11, 2022.06.15 යන දිනයන් නියම කලත් කාර්යාල වසා තිබීම මත 2022.09.06 වන දින නැවත නඩුව විභාගයට ගෙන පැමිණිලිකරුගේන් සාක්ෂි කැඳවන ලදී. හරස් ප්‍රශ්න ඇසීම 2022.11.02 ට නියම කළත් එදින ඉල්ලුම්කරු නොපැමිණිය නිසා 2022.12.02 දිනට විභාගය නියම කරන ලදී. 2022.11.25 ඉල්ලුම්කරු ලිපියක් එවමින් නඩුව අවසන් කරන මෙන් ඉල්ලා ඇත. 2022.12.02 දින ඉල්ලුම්කරු පැමිණ තවදුරටත් නඩුව ගෙනයාමට තීරණය නොකරන බවත් 2022.11.25 වන දින ලිපිය අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත බේරුම්කරණය අවසන් කරමි.

නඩුව බේරුම්කරණයෙන් ඉවත් කිරීමට හේතු වූයේ රටේ පැවැති තත්ත්වය සහ සේවයෙන් ඉවත්කළ සේවකයෙකුට ඇති වූ ආර්ථික අපහසුතා නිසා වුවත් කාර්මික ආරාවුල් පනතට අනුව නඩුව අවසන් කිරීමට සිදුවී ඇත . මෙය සාධාරණ සහ යුක්තිසහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**ආර්. එස්. ආරියප්පෙරුම**
බේරුම්කරු.

EOG 03 - 0148

---

මගේ අංක: IR/COM/01/2017/01.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.07.08 දිනැති හා අංක 2183/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.03.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. නුගේගොඩ, උඩහමුල්ල, පරණ කොට්ටාව පාර, අංක 487/4R හි පදිංචි පුෂ්පා ඇල්ලපල්ලගේ මිය, 2. වේයන්ගොඩ, මිහිඳු මාවත, අංක 53/7 හි පදිංචි ඩබ්. පී. එස්. එස්. වීරසිංහ මිය සහ කොළඹ 07, මේට්ලන්ඩ් පෙදෙස, අංක 47/5 හි පිහිටි ජාතික විද්‍යා පදනම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 27 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

IR/COM/01/2017/01.
නඩු අංකය: ඒ/15/2020.

1. පුෂ්පා ඇල්ලපල්ලගේ,
   අංක 487/4 ආර්,
   පරණ කොට්ටාව පාර,
   උඩහමුල්ල,
   නුගේගොඩ.

2. ඩබ්. පී. එස්. එස්. වීරසිංහ,
   අංක 53/7,
   මිහිඳු මාවත,
   වේයන්ගොඩ.

*පළමු පාර්ශ්වය*

*එදිරිව*

ජාතික විද්‍යා පදනම,
අංක 47/5,
මෙට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 07,

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරවුල.

*පෙනී සිටීම* -

පළමු පාර්ශ්වය වෙනුවෙන් - ග්‍රේෂන් සිල්වා මහතා (නියෝජිත)
දෙවන පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ ශෂික හෙට්ටිආරච්චි මහතා

*බලතල පැවරීම*

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා හිටපු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04, 1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය වන කාර්මික ආරවුල පනතේ 4(1) වගන්තියෙන් එතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඒකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත යොමු කර ඇත.

*එකී කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ*

''ජාතික විද්‍යා පදනමේ සේවය කරන පුෂ්පා ඇල්ලපල්ලගේ සහ ඩබ්. පී. එස්. එස්. වීරසිංහ යන අයව ගිණුම් නිලධාරී තනතුරට පත් නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් දෙදෙනාට හිමි විය යුතු සහන මොනාවාද? යන්න පිළිබඳ වේ.''

*ආරාවුලට අදාළ පසුබිම*

මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා වන පුෂ්පා ඇල්ලපල්ලගේ පොත් තබන්නා තනතුරේ හා ඩබ්. පී. එස්. එස්. වීරසිංහ යන අය සහකාර කළමනාකරණ III ශ්‍රේණිය යන තනතුරේ ජාතික විද්‍යා පදනමේ සේවය කරමින් සිටියදී ජාතික විද්‍යා පදනම මගින් ගිණුම් නිලධාරී තනතුර සඳහා බාහිර අයදුම්කරුවන්ගෙන් ( ආයතනය තුළ සිටින සේවකයින්ට ද අයදුම්කළ හැකි වන සේ) අයදුම්පත් කැඳවා ඇත.

එහිදී මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා ද අදාළ තනතුර සඳහා අයදුම්කර ඇත. ඒ අනුව මොවුන් දෙදෙනා අදාළ සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර එම සම්මුඛ පරීක්ෂණයේදී මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා වැඩිම ලකුණු ලබාගැනීම මත ගිණුම් නිලධාරි තනතුර සඳහා දෙවන පාර්ශ්වයේ ආයතනය මගින් තෝරාගෙන 2014.07.21 දින නව තනතුර සඳහා අදාළ පත්වීම් ලිපි නිකුත් කර ඇත. 2014.08.11 දින නව පත්වීමට අදාළ වැටුප් ගෙවීම අත්හිටුවන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් අභ්‍යන්තර ගෙවීම් පත්‍රිකාවක් මගින් ගණකාධිකාරිවරිය වෙත දන්වා ඇත. පසුව 2014.09.15 වන දින කළමනාකරණ අංශය මගින් කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා පත්වීම අහෝසි කර පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා වන පුෂ්පා ඇල්ලපල්ලගේ යන අය නැවත පොත් තබන්නා තනතුරටද, ඩබ්. පී. එස්. එස්. වීරසිංහ යන අය සහකාර කළමනාකරණ III ශ්‍රේණියේ තනතුරට ද, පත්කර ඇත. එහි දී මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාට සිදු වී ඇති අසාධාරණය සම්බන්ධයෙන් පාලන අධිකාරියෙන් නිතර නිතර සාධාරණයක් ඉටුකර දෙන ලෙස ඉල්ලීම් කළ ද, කිසිදු සාධාරණ තීරණයක් නොලැබීම මත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා කරන ලද පැමිණිල්ලක් අනුව අවස්ථා කිහිපයක දී මෙම පැමිණිල්ල විභාග කළ ද කිසිදු ආකාරයකින් සමතයට පත්කර ගැනීමට නොහැකිවීම මත මෙම පැමිණිල්ලට අදාළ ආරාවුල බේරුම්කරණය මගින් තීරණයක් ලබාදීමට යොමු කර ඇත.

*සාක්ෂි විශ්ලේෂණය*

මෙම ආරාවුල පළමු පාර්ශ්වයේ පළමුවැන්නා වන පුෂ්පා ඇල්ලපල්ලගේ යන අය 2012.09.17 වන දින ජාතික විද්‍යා පදනමේ පොත් තබන්නා තනතුරට පත්කර ඇති බව පළමු පාර්ශ්වයේ පළමුවැන්නා වන පුෂ්පා ඇල්ලපල්ලගේ යන අය විසින් බේරුම්කරණ විනිශ්චය සභාවේ දී සලකුණු කර ඉදිරිපත් කරන ලද " A1 " දරන පත්වීමේ ලිපියෙන් ද සනාථ වේ.

මෙම ආරාවුලේ පළමු පාර්ශ්වයේ දෙවැන්නා වන ඩබ්. පී. එස්. එස්. වීරසිංහ යන අය ද 2012.09.17 වන දින ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ සහකාර (III ශ්‍රේණියට) ලෙස සේවයට බැඳී ඇති බව පළමු පාර්ශ්වයේ දෙවැන්නා වන ඩබ්. පී. එස්. එස්. වීරසිංහ යන අය විසින් සාක්ෂි ලබා දෙන අවස්ථාවේ දී බේරුම්කරණ විනිශ්චය සභාවට සලකුණු කර ඉදිරිපත් කර ඇති " A10 " දරන ලේඛනය මගින් තහවුරු වේ.

මෙසේ මොවුන් දෙදෙනාම පත්වීම් ලැබ සේවය කර ඇත්තේ ගිණුම් අංශයේ ප්‍රධාන ගිණුම් නිලධාරිනියගේ අධීක්ෂණට යටතේ බව මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා ලබා දී ඇති සාක්ෂි මගින් ද, දෙවන පාර්ශ්වයේ ආයතනය වන ජාතික විද්‍යා පදනම වෙනුවෙන් සාක්ෂි ලබාදුන් එම ආයතනයේ මානව සම්පත් සංවර්ධන නිලධාරී වන ඉපලවත්තගේ සමන් සුජීව යන අයගේ සාක්ෂි මගින් ද තහවුරු වේ.

මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා දෙවන පාර්ශ්වයේ ආයතනය වන ජාතික විද්‍යා පදනම සේවය කරමින් සිටියදී ආයතනයේ 2013.10.04 සහ 2013.11.01 යන දින වලදී කණිෂ්ඨ කළමනාකරණ සේවා කාණ්ඩයට අයත් ගිණුම් තනතුරු දෙකක් පුරප්පාඩු වී තිබූ බව මෙම ආරාවුලට ආදාළව 2022.04.21 වන දින දෙවන පාර්ශ්වයේ ආයතනය වන ජාතික විද්‍යා පදනම වෙනුවෙන් සාක්ෂි ලබාදුන් මානව සම්පත් සංවර්ධන නිලධාරී වන ඉපලවත්තගේ සමන් සුජීව යන අයගේ වාචික සාක්ෂි මගින් තහවුරු වේ. ආයතනික බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය මත එම පුරප්පාඩු පිරවීම සඳහා අවසර ලබා ගැනීමට 2013.07.18 වන දින අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර ඊට අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2013.08.23 වන දින ලබා දී ඇත. ඒ බව දෙවන පාර්ශ්වයේ ආයතනය වන ජාතික විද්‍යා පදනම වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරී වන ඉපලවත්තගේ සමන් සුජීව විසින් සලකුණු කර බේරුම්කරණ මෙම විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇති ' R 7 " දරන ලේඛනය මගින් තහවුරු වේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් උපදෙස් හා අනුමැතිය ප්‍රකාරව ගිණුම් නිලධාරි තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමක් කර ඇති අතර මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා ඒ වන විට පරිවාස කාල සීමාවක සිටි බැවින් මෙම පුරප්පාඩු තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්පත් යොමුකර නොමැත.

අභ්‍යන්තරව ඉල්ලුම්පත් කැඳවා මෙම සම්මුඛ පරීක්ෂණයට වෙනත් ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු කැඳවුව ද, එම ඉල්ලුම්කරුවන් අවශ්‍ය සාධනීය ලකුණු ලබා ගැනීමට නොහැකි වීම මත හා අවශ්‍ය ශක්‍යතා මට්ටමේ නොමැති වීම මත එම ඉල්ලුම්කරුවන් අතරින් කිසිවකු තෝරාගෙන නොමැති බව මෙම ආරාවුලට අදාළව දෙවන පාර්ශවයේ ආයතනය වන ජාතික විද්‍යා පදනම වෙනුවෙන් සාක්ෂි ලබාදුන් මානව සම්පත් සංවර්ධන නිලධාරී වන ඉපලවත්තගේ සමන් සුජීව යන අයගේ සාක්ෂි මගින් තහවුරු වේ.

ඉන් අනතුරුව බාහිර අයදුම්කරුවන් කැඳවීමකින් තොරව පුරප්පාඩු වූ ගිණුම් නිලධාරි තනතුරු දෙකට හා කණිෂ්ඨ කළමනාකරණ සේවා කාණ්ඩයට අයිති තනතුරු 10 කට හා පුරප්පාඩු වූ ගිණුම් නිලධාරි තනතුරු දෙකට හා ප්‍රසම්පාදන සහ ප්‍රවාහන නිලධාරි යන තනතුරුවලට අදාළව සුදුසුකම් සංශෝධනය සඳහා ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කර ඇත. ඒ සඳහා අවසර ලබා දී ඇති බව දෙවන පාර්ශවයෙන් ආයතනය වන ජාතික විද්‍යා පදනම වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරිවරයා ලබා දුන් සාක්ෂි මගින් තහවුරු වන අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අදාළ ඉල්ලීම කිරීමට

පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ ලබාගත යුතු වුව ද, ආයතනය මගින් එවැනි නිර්දේශයක් ලබා නොගෙන අදාළ සුදුසුකම් සංශෝධනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් නැවතත් ඉල්ලීමක් කර ඇති බව මෙම ආරාවුලට අදාළව දෙවන පාර්ශවයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරිවරයාගේ සාක්ෂි මගින් වැඩිදුරටත් තහවුරු වේ.

ගිණුම් නිලධාරි තනතුරට අදාළව සංශෝධන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාදුන් බවට අදාළ ලිපිය " R8 " ලෙස ද, සංශෝධිත සුදුසුකම් වලට අදාළ ලේඛනය " R8 (a) " ලෙසද බේරුම්කරණ විනිශ්චය සභාවට දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරිවරයා මගින් දෙවන පාර්ශ්වයේ ආයතනය විසින් සලකුනු කර ඉදිරිපත් කර ඇති ලිඛිත සාක්ෂි මගින් තහවුරු වේ.

මෙම " R8 " ලේඛනයට අනුව සංශෝධනය කරන ලද සුදුසුකම් මත බාහිර අයදුම්කරුවන් ලෙස ගිණුම් නිලධාරි තනතුර අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති ආයතනයේ සේවය කරන අයෙකුට වුව ද, මෙම තනතුරට අයඳුම් කිරීමට හැකියාව ලැබී ඇත. එහිදී ආයතනික සේවා කාලය කොපමණ ද යන්න සලකා බලා නොමැති බවත්, එදිනම වුවත් ආයතනයට බැඳුන සේවකයෙකුට වුව ද, මෙම තනතුර සඳහා බාහිර අයඳුම්කරුවකු ලෙස ඉල්ලුම් කිරීමට හැකියාව තිබූ බව ද මෙම ආරාවුලට අදාළව සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරිවරයාගේ සාක්ෂි මගින් හා මෙම බේරුම්කරණ විනිශ්චයට සභාවේදී සලකුණු කර ඉදිරිපත් කරන ලද " R8 (a) " දරන ලේඛනමය සාක්ෂි මගින් ද තහවුරු වේ.

ඒ අනුව මෙම සංශෝධනවලට අදාළව මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් ගිණුම් නිලධාරි තනතුරු සඳහා අයදුම්කර ඇති අතර ඒ අනුව එම දෙදෙනා 2014.07.01 වන දින ආයතනය විසින් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා ඇති බව " A3 " දරන ලේඛනය මගින් ද, මෙම ආරාවුලේ පළමු පාර්ශවකරුවන් දෙදෙනාගේ වාචික සාක්ෂි මගින් ද, දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරියාගේ සාක්ෂි මගින් ද තහවුරු වේ.

තවද මෙම සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්කරුවන් තිදෙනෙකු සහභාගී වී ඇති අතර මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා පිළිවෙලින් ලකුණු 85, 81 ලබා ගනිමින් ගිණුම් නිලධාරි තනතුරට අදාළව පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් ඉහලම ලකුණු ලබාගෙන සමත් වී ඇති බවත්, ඒ අනුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා තේරී පත්වී ඇති බවත්, මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන්ගේ සාක්ෂි මගින් ද, මෙම ආරාවුලට අදාළ දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරියාගේ සාක්ෂි මගින්ද තහවුරු වේ. තව ද මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබූ බවත් එයට විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ නිලධාරීන් පවා සහභාගී වී සිටි බවත් මෙම ආරාවුලට අදාළව සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරිවරයා සාක්ෂි ලබාදෙමින් පිළිගෙන ඇත.

මෙම සම්මුඛ පරීක්ෂණයෙන් පසුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාට පිළිවෙලින් 2014.07.21 වන දින දරන " A4 හා A11 " දරන පත්වීම් ලිපි ආයතනය මගින් ලබා දී ඇති අතර එම පත්වීම් ලිපි මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා අත්සන් කර පිළිගෙන ඇත. මෙම පත්වීමේ ලිපි ලබා දීමෙන් පසුව ආයතනයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා විසින් 2014.08.05 වන දින රාජකාරී ලැයිස්තු මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා වෙත වෙන වෙනම ලබා දී ඇත. එසේ ලබාදුන් රාජකාරී ලැයිස්තු " A5 හා A12 " ලෙස මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් සලකුණු කර බේරුම්කරන විනිශ්චය සභාවේදී ලේඛනමය සාක්ෂියක් ලෙස ඉදිරිපත් කර ඇත.

මෙම පළමු පාර්ශවකරුවන් දෙදෙනා මෙසේ සේවය කරමින් සිටියදී අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් 2014. 08. 11 වන දින ගිණුම් අංශයට එවන ලද අභ්‍යන්තර මෙමෝවක් මගින් කිසිදු සාධාරණ හේතුවක් නොදන්වා ගිණුම් නිලධාරි තනතුරට අදාළ වැටුප අත්හිටුවන ලෙස දන්වා එවා ඇත. ඒ බව පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් ලබාදුන් සාක්ෂි මගින් ද, මෙම ආරවුලට අදාල පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා මගින් සලකුණු කර ඉදිරිපත් කර ඇති " A6" දරන ලේඛනය මගින් ද තහවුරු වේ.

ඉන් අනතුරුව 2014. 09. 15 වන දින ගිණුම් නිලධාරි තනතුරට අදාල පත්වීම් අහෝසි කරන බවට දන්වා අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් මෙම ආරවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාට ලිපියක් මගින් දන්වා ඇති බව බේරුම්කරණ විනිශ්චය සභාවේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා පිළිවෙලින් සලකුණු කර ඉදිරිපත් කරන ලද " A7 හා A13 " දරන ලිපි මගින් ද, පළමු පාර්ශ්වකරුවන්ගේ සාක්ෂි මගින් ද, දෙවන පාර්ශවයේ ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් මානව සම්පත් සංවර්ධන නිලධාරිවරයාගේ සාක්ෂි මගින් ද තහවුරු වේ.

එම ලිපිය ලද පසු මෙම ආරවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා අදාළ ලිපි පිළිනොගෙන එයින් තම පත්වීම් අවලංගු කිරීමට හේතු විමසා අධ්‍යක්ෂ ජනරාල්වරිය වෙත 2014. 08. 19 වන දින ලිපියක් යවා ඇති බව " A8" දරන ලේඛණය මගින් සනාථ කර ඇත. එයට සාධාරණ නොවන පිළිතුරක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරියගෙන් ලද බව පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් පිළිගෙන ඇති අතර එය මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාගේ සාක්ෂි මගින් ද, බේරුම්කරණ විනිශ්චයසභාවේ දී පළමු පාර්ශවකරුවන් දෙදෙනා විසින් සලකුණු කර ඉදිරිපත් කරන ලද " A9" දරන ලේඛනමය සාක්ෂි මගින් ද තහවුරු වේ.

තවද ඉන් අනතුරුව දෙවන පාර්ශ්වීය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාව ගිණුම් නිලධාරි තනතුර ලැබීමට පෙර තිබූ තනතුරු සඳහා නැවත වරක් පත්කිරීම් කර ඇති බව පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාගේ සාක්ෂි මගින් තහවුරු වන අතර ඒ අනුව මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා පිළිවෙළින් පුෂ්පා ඇල්ලපල්ලගේ යන අය පොත් තබන්නා තනතුරට හා ඩබ්. පී. එස්. වීරසිංහ යන අය සහකාර කළමනාකරණ සේවා ( III ශ්‍රේණිය) තනතුරේ පිහිටුවා ඇත. ඒ අනුව මෙම ආරාවුලේ පළමු පාර්ශවකරුවන් දෙදෙනා එම තනතුරුවල රාජකාරී මේ වන තෙක් සිදු කරගෙන යන බව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන්ගේ සාක්ෂි මගින් තහවුරු වේ.

මෙම ආරාවුලට අදාලව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සියලු වාචිකමය හා ලේඛනමය සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව තහවුරු වනුයේ මෙය හුදෙක්ම ආයතනික පරිපාලනමය ක්‍රියාපටිපාටියක සිදු වූ වැරදි තීරණ මත සිදු වූ ආරාවුලක් බවත් එයට කිසිසේත්ම මෙම ආරාවුලට මුහුණ දුන් පළමු පාර්ශ්වකරුවන් වග නොකියයුතු බවත් ය.

මෙම ජාතික විද්‍යා පදනමේ ගිණුම් නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේදී සිදු වී ඇති සියලු අක්‍රමිකතා හා අදූරදර්ශී හිතුවක්කාරි ක්‍රියා මාර්ග සියල්ලම එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සහ එවකට අධ්‍යක්ෂ ජනරාල්වරියට කළමනාකරණ සහය ලබාදී ඇති පරිපාලන නිලධාරින්ගේ වැරදි තීරණ නිසා සිදු වී ඇති බව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් මානව සම්පත් නිලධාරීවරයාගේ වාචික සාක්ෂි මගින් ද, එම නිලධාරිවරයා මගින් බේරුම්කරණ විනිශ්චය සභාවට සළකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛනමය සාක්ෂි මගින් ද වඩ වඩාත් තහවුරු වේ.

ආයතනයක පරිපාලන කටයුත්තක දි ගන්නා අනීතික ක්‍රියා මාර්ගවලට සේවකයින් වගකීමට ලක් කිරීම කිසිසේත්ම් සිදු විය නොහැක්කක් වන අතර, ආයතනික වශයෙන් යම් ක්‍රියාදාමයක් සිදු වන විට එයට ගත යුතු නීතිමය හා පරිපාලනමය නිවැරදි තීරණ ඉහළ පරිපාලන අධිකාරිගෙන් ගත යුතු අතර ඔවුන් ලබාගත් වැරදි තීරණ මගින් අත්විදීමට සිදුවන අනිටු ප්‍රතිඵල සේවකයින් මත පාලන අධිකාරිය පැටවීම නීතිමය තත්වය මත හා වෘත්තීමය ආචාර ධර්මවලට පටහැනි ක්‍රියාදාමයක් වන අතර මෙම ආයතනය තුළ මෙලෙස අදූරදර්ශී ක්‍රියා මාර්ග ආයතනයේ ඉහළ පාලන අධිකාරිය වන අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් ගැනීම විමතියට කරුණක් වන අතර මෙවැනි ක්‍රියා මාර්ග මගින් අධිකරණ වලදී එම ආයතන වලට සිදුවන අපකීර්තිය ද, එවැනි අවස්ථාවල ආරාවුල විභාගය සඳහා ආයතනයෙන් පැමිණෙන නිලධාරින්ට මුහුණ දීමට සිදුවන අපහසුතා ද, ආයතනික ප්‍රතිරූපයට සිදුවන හානිය ද, සුලුපටු නොවේ.

තවද මෙම ආරාවුල විභාග වීමට ප්‍රථම වග උත්තරකාර ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් 2020.07.30 වන දින බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇති පිළිතුරෙන් පවා පිළිගෙන ඇත්තේ " අමාත්‍යංශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් මෙම පත්වීම් ලබා දීමේ දී අනුගමනය කළ ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයෙන් පසුව ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව, මෙම නිලධාරින් (පළමු පාර්ශවකරුවන්) සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම නිලධාරීන් තොරා ගෙන ඇති බවත් ය. එවැනි පසුබිමක මෙම ආරාවුලට අදාළව ඉදිරිපත් වූ දෙපාර්ශ්වයේම ලේඛනමය සහ වාචිකමය සාක්ෂි සලකා බලා මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාව ආයතනය විසින් ගනු ලැබ ඇති වැරදි පරිපාලනමය තීරණ සඳහා වගකීමට ලක් කිරීම කිසිසේත්ම කළ නොහැක්කක් බැවින්, මෙම ආරාවුලට අදාළ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා 2014.07.21 වන දින සිට සේවය කඩ වීමකින් තොරව ගිණුම් නිලධාරී තනතුරේ පිහිටුවීම ප්‍රදානයක් ලබා දෙන අතර ගිණුම් නිලධාරී තනතුරේ රාජකාරී මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් මේ වන තෙක් සිදු කර නොමැති බැවින් ද, ආයතනය විසින් මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා ගිණුම් නිලධාරී තනතුරට පත්කිරීමට පෙර සිටින ලද තනතුරට අදාළ ආරාවුලෙන් පසු පත් කිරීමට තීරණය කර මෙම පළමු පාර්ශ්වකරුවන් දෙදෙනාව එම තනතුරුවල පිහිටු වන ලද ඇති බැවිනුත්, එම ගිණුම් නිලධාරී තනතුරු ලැබීමට පෙර සිටි තනතුරුවල මේ වන තෙක් පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා, දෙවන පාර්ශ්වීය ආයතන තුල රාජකාරී කටයුතුවල නිරත වන බැවිනුත්, පසු වැටුප් ගෙවීමට ප්‍රදානයක් නොකරමි.

ඒ අනුව මෙම ආරාවුලේ පළමු පාර්ශ්වකරුවන් දෙදෙනා 2014.07.21 වන දින සිට ගිණුම් නිලධාරි ( JM 1-2 - GRADE II) තනතුරේ සේවය කඩවීමකින් තොරව පිහිටුවා රු. 20, 890 - 10 x 365 - 18 x 550 – රු. 34, 440 යන වැටුප් පරිමාණයේ අටවන වැටුප් පියවර වන රු. 23810 හා පසු වැටුප් රහිතව ගැසට් කළ දින සිට සේවයේ පිහිටු වීමට නියම කරමින් මෙම ප්‍රදානය නිකුත් කරමි.

මෙම ප්‍රදානය ක්‍රියාත්මක කර සති දෙකක් ඇතුළත ඒ බව මැද කොළඹ කම්කරු කොමසාරිස් වෙත වාර්තා කරන ලෙස නියෝග කරමි.

ඉහත කාරණා හේතුවෙන් මෙම ප්‍රදානය කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බවට තීරණය කරමි.

කේ. කේ. කේ. ධනපාල
බේරුම්කරු.

2023 පෙබරවාරි මස 08 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

03 – 149

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය :- A/74/2018.
IR/COM/03/2017/178.

ඩී. එන්. වන්නිආරච්චි,
''සිරි නිවස'',
සිරිබද්දනගේවත්ත,
නාදුගල, මාතර

සහ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක. 200, කිරුළ පාර,
කොළඹ 05.

අතර ඇති කාර්මික ආරාවුල

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින්, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමග කියවා ) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අන පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය ) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා ඇමතිවරයා විසින් 2018.10.11 වන දින බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් IR/COM/03/2017/178 අංකය යටතේ ගොනු කර ඇති ලේඛනය අනුව ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"2014.07.21 වන දින ඇති වී ඇති සිදුවීමට අදාළව ඩී. එන්. වන්නිආරච්චි මහතා සම්බන්ධයෙන් පවත්වා ඇති විනය පරීක්ෂණය සාධාරණ හා යුක්ති සහගත අයුරින් පවත්වා තිබේද? එකී විනය පරීක්ෂණයේ නියෝගය මගින් ඒ මහතාට අසාධාරණයක් සිදු වී තිබේද? අසාධාරණයක් සිදුවී ඇත්නම් ලැබිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

''දෙපාර්ශ්වය විසින් අදාළ විස්තර ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු 2019.11.22 වන දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත පී. එම්. තිලකසිරි මහතාද දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතීඥ මිල්මී අබේසුන්දර මහත්මිය ද පෙනී සිටියදී මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට හැකිදැයි විමසා බලන ලදී. එසේ නිරවුල් කිරීමට හැකියාවක් නොතිබුණ නිසා අදාළ කරුණ පිළිබඳව සාක්ෂි ලබා ගැනීමට තීරණය කළෙමි.

ඒ අනුව 2019.11.22 වන දින හා 2020.01.24 වන දින ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි ලබා දෙන ලදී. එම සාක්ෂියේදී A1 සිට $A17^a$, $A17B^B$, A17 යන ලේඛන ලකුණු කරන ලදී. දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරු ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව සිටියදී දෙපාර්ශ්වය අතර සමථයක් ඇති කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව කරුණු ඉදිරිපත් වූයෙන් ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන ලදී.කෙසේ වෙතත් එවැනි සමථයක් ඇති නොවුන නිසා 2020.09.25 වන දින දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. එසේ හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී දෙවන පාර්ශ්වය R1 සිට R10 දක්වා වූ ලේඛන ද ලකුණු කරන ලදී. 2021.03.19 වන දින ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්න අසා A1 සිට A 17 දක්වා වූ ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කාර පාර්ශවයේ නඩුව අවසන් කරන ලදී.

2021.03.25 වන දින දෙවන පාර්ශ්වය ශ්‍රී ලංගම සහකාර කළමනාකරු (ධාවන) අශෝක චන්දන හේමන්ත මහතා සාක්ෂියට කැඳවන ලදී. එම සාක්ෂියේදී R11 සිට R14 දක්වා වූ ලේඛන ද ලකුණු කරන ලදී. 2020.09.02 වන දින ඉල්ලුම්කාර පාර්ශ්වය. එම සාක්ෂි කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලද අතර 2022.11.11 දින නැවත ප්‍රශ්න අසා එම පාර්ශ්වයන්ගේ සාක්ෂි කැඳවීම අවසන් කරන ලදී.

ඉන් පසු දෙපාර්ශ්වයම ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලද අතර ලිඛිත දේශන ඉදිරිපත් කිරීමෙන් පසු මෙම තීරණයට එළඹෙන ලද්දේ ඉදිරිපත් වූ සාක්ෂි ද, ලේඛන ද, ලිඛිත දේශන ද සළකා බැලීමෙන් පසුවය.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී A1, A2, A3 හා A4 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු ලෙස වරින් වර ඔහු වෙත ලබාදෙන ලද පත්වීම් ලිපි වේ. දෙවන පාර්ශ්වයද එම ලිපි R වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛන පිළිබඳ දෙපාර්ශ්වය අතර හබයක් නොතිබුණ අතර මෙම කාර්මික ආරාවුලට ඇති වී ඇත්තේ ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංගම රියදුරෙකු ලෙස සේවය කරමින් සිටියදී ය.

ඉල්ලුම්කරු ශ්‍රී ලංගම මාතර ඩිපෝවේ රියදුරෙකු වශයෙන් කටයුතු කරමින් සිටියදී 2014.07.21 වැනි දින එම ඩිපෝවේ ස. ක. (ධා) පී. පී. යූ. ශාන්ත කුමාර මහතාට අපහාස වන අයුරින් බැන වැදීම පිළිබඳව සිද්ධියක් මෙම ආරාවුලට හේතු වී ඇත. එම සිද්ධිය සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය. 2014.08.08 වැනි දින සිට ඉල්ලුම්කරුගේ සේවය තහනම් කර ඇත. (A7) එසේ සේවය තහනම් කර ඇත්තේ ශ්‍රී ලංගම ව්‍යවස්ථා මාලාවේ 4 වන වගන්තිය ප්‍රකාරව ය. එම ලිපියේ දැක්වෙන්නේ සේවය තහනම් කරන ලද්දේ අර්ධ වේතන සහිතව බවය.

දෙපාර්ශ්වය අතර ඇති වී ඇති ආරාවුල සම්බන්ධයෙන් විමසීමට ලක් කළ යුතු ප්‍රධාන කරුණු වන්නේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය පවත්වා ඇති විනය පරීක්ෂණය සාධාරණ හා යුක්ති සහගත අයුරින් පවත්වා තිබේද යන්න වේ. මෙම විමසීමේදී විනය පරීක්ෂණයට අදාළව දෙපාර්ශ්වය විසින් ලේඛන කීපයක් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඉල්ලුම්කරු වෙනුවෙන් A7 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ශ්‍රී ලංගම මාතර ඩිපෝවේ කළමනාකරු විසින් 2014.08.08 දාතමින් ඉල්ලුම්කරු වෙත යවන ලද සේවය තහනම් කිරීමේ ලිපිය යි. එහි සඳහන් වන්නේ ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාවේ 4 වන වගන්තිය යටතේ ඉල්ලුම්කරුගේ සේවය අර්ධ වේතන සහිතව තහනම් කරනු ලබන බවයි. අනතුරුව ඉල්ලුම්කරුට 2014.08.11 දාතමින් චෝදනා 5 කින් යුත් චෝදනා පත්‍රයක් ද භාර දී ඇති අතර එහි වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු බරපතල විෂමාචාර එකක් හෝ කීපයක් සිදු කර ඇති නිසා සේවයෙන් පහ කිරීමට හෝ වෙනත් දඬුවමක් නොපැමිණවීමට හේතු ඇත්නම් දින 14 ක් ඇතුළත ලිඛිතව දන්වා සිටින ලෙසයි. (A8) ඒ අනුව ඉල්ලුම්කරු 2014.08.19 දාතමින් ඩිපෝ කළමනාකරු වෙත නිදහසට කරුණු ඉදිරිපත් කරමින් චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා එකක් කීපයක් හෝ සියල්ල සිදු කර නොමැති බවත් ඒ නිසා එකී චෝදනා වලින් නිදහස් කර හිඟ වේතන සහිතව සේවයේ පිහිටුවන ලෙසත් ඉල්ලා ඇත.

ඉන්පසු දෙවන පාර්ශ්වය 2014.09.27 දාතමින් යුත් ලිපිය මගින් ඉල්ලුම්කරුට දන්වා ඇත්තේ 2014.07.26 දින මාතර ඩිපෝවේ ස. ක. ( ධාවන) පී.පී.යූ. ශාන්ත කුමාර මහතාට අපහාස වන අයුරින් බැන වැදීම සම්බන්ධයෙන් ලබා දී ඇති චෝදනා පත්‍රය මත පිහිටා ඉල්ලුම්කරුට විරුද්ධව විනය විභාගයක් 2014.10.07 වැනි දින පවත්වන බවත් ඒ සඳහා සූදානම් වී පැමිණෙන ලෙසත් ය. (A12) ඒ අනුව සිය නියෝජිතයෙකු මගින් ඉල්ලුම්කරු විනය පරීක්ෂණයට සහභාගි වී ඇත. එකී විනය පරීක්ෂණයේ සම්පූර්ණ සටහන් මෙම නඩුවට ගොනු වී ඇත.

විනය පරීක්ෂණය අවසානයේ විනය පරීක්ෂණය පැවැත්වූ ආකාරය සතුටුදායක බවට පළමු පාර්ශ්වය වන වන්නිආරච්චි මහතා ද ඔහු වෙනුවෙන් එහි සිටි නියෝජිත ද අත්සන් තබා ඇත. අනතුරුව එල්ල කරන ලද චෝදනාවන්ට ඉල්ලුම්කරු වරදකරු කර ඇති අතර ඩිපෝ කළමනාකරු විනය නියෝගය ක්‍රියාත්මක කරමින් 2015.02.02 වැනි දින ඉල්ලුම්කරුට දන්වා ඇත්තේ,

" සේවා තහනම් කාලයට නොගෙවූ වේතන අහිමි කරමින් පහත සඳහන් දඬුවම් නියම කරන බවය. "

1. මාස දෙකක (2) කාලයකට සේවය තාවකාලිකව අත්හිටුවීම,

2. මින් ඉදිරියට මෙවැනි චෝදනාවලට වරදකරු වුවහොත් සේවයෙන් පහ කරන බවට තරයේ අවවාද (A14).

ඒ අනුව 2015.02.03 වැනි දින සිට 2015.04.02 (දෙදිනම ඇතුළත්ව) ඉල්ලුම්කරුගේ සේවය තහනම් කරන ලද අතර 2015.04.03 වැනි දින සේවයට වාර්තා කරන ලෙසද දන්වා ඇත.

එම විනය නියෝගයට එරෙහිව ඉල්ලුම්කරු අභියාචනා ඉදිරිපත් කර ඇති අතර අභියාචන විභාගයේදී ඉදිරිපත් කළ සියලු කරුණු හා විනය ලිපි ගොනුව සලකා බලා අභියාචනා මණ්ඩලය ඉල්ලුම්කරුට නියම කර ඇති දඬුවම් පහත සඳහන් ආකාරයට සංශෝධනය කිරීමට තීරණය කර ඇත. (2015.05.15 දින ලිපිය පැ15)

එම ලිපියේ සඳහන් කර ඇත්තේ,

ඒ අනුව ඔබට සේවය තහනම් කර සිටි කාලයේ නොගෙවූ වේතනය අහිමි කරමින් මතු සඳහන් දඬුවම් නියම කරමි.

1. මාස එකක (1) කාලයකට සේවය තාවකාලිකව අත් හිටුවීම,

2. ඉදිරියේදී සමාන චෝදනාවන්ට ලක්වුවහොත් සේවයෙන් පහ කරන බවට තරයේ අවවාද කිරීම.

අභියාචනා තීන්දුව ක්‍රියාත්මක කරමින් ඩිපෝ කළමනාකරු 2015.05.29 දාතමින් යුත් ලිපිය මගින් ඉල්ලුම්කරුට දන්වා ඇත්තේ ( A16) 2015,06.03 දින සිට 2015.07.02 වන දින (දෙදිනම ඇතුළත්ව) ඉල්ලුම්කරුගේ සේවය මාස එකක සේවා අත්හිටුවීමකින් පසුව 2015.07.03 වැනි දින මාතර ඩිපෝවේ ඩිපෝ කළමනාකරු වෙත සේවයට වාර්තා කළ යුතු බවය. ඒ අනුව ඉල්ලුම්කරු සේවයට වාර්තා කර ඇත.

දෙවන පාර්ශ්වය සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු අවස්ථා ගණනාවකම ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවට පටහැනිව නීති රීති උල්ලංඝනය කරමින් කටයුතු කිරීම මත චෝදනා පත්‍ර ගොනු කර විනය පරීක්ෂණ පවත්වා ඇති බවත් එහිදී තරයේ අවවාද කිරීම්වලට ලක්ව තිබියදීත් මේ ආකාරයට නැවතත් විෂමාචාර ක්‍රියාවක නිරත වීමට අදාළව ඉල්ලුම්කරු කෙරෙහි සාධාරණ හා යුක්ති සහගත ලෙස කටයුතු කර ඇති බවය.

සාක්ෂි විභාගයේදී ඉදිරිපත් කරන ලද ලේඛන පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ, ඉල්ලුම්කරුගේ වැඩ අර්ධ වේතන සහිතව තහනම් කිරීම, ඉල්ලුම්කරුට චෝදනා පත්‍රයක් භාර දීම, එම චෝදනාවලට දින 14 ඇතුළත දඬුවම් නොපැමිණවීම හේතු දක්වන ලෙස දන්වා සිටීම, ඒ අනුව ඉල්ලුම්කරු නිදහසට කරුණු ඉදිරිපත් කිරීම, අනතුරුව විනය පරීක්ෂණයක් පවත්වන බව ඉල්ලුම්කරුට දන්වා සිටීම, ඉල්ලුම්කරු නියෝජිතයකු සමග විනය පරීක්ෂණයට සහභාගී වීම විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු විනය නියෝගය ඉල්ලුම්කරුට දන්වා යැවීම, ඉල්ලුම්කරු අභියාචනයක් ඉදිරිපත් කිරීම, අභියාචනා මණ්ඩලය ඉල්ලුම්කරුගේ දඬුවම් අඩු කිරීම, යන ක්‍රියාදාමය සලකා බලන විට ඉල්ලුම්කරුට එරෙහිව පවත්වා ඇති විනය පරීක්ෂණය සාධාරණ හා යුක්ති සහගත අයුරින් පවත්වා ඇති බවට සෑහීමකට පත් වෙමි.

විනය පරීක්ෂණය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ සඳහන් කර ඇත්තේ "විනය විභාගයේදී කොපමණ සාක්ෂි ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළද ඒ කිසිදු සාක්ෂියක් විමර්ශනයට උපයෝගී කර නොගෙන ඉල්ලුම්කරුට දඬුවම් කිරීමේ අදහසින් සහකාර කළමනාකරුගේ සමීපතම නිලධාරියෙක් සාක්ෂියට කැඳවා විනය විභාගය අවසන් කරන ලද බවයි " එහෙත් විනය විභාගය අවසානයේ ඉල්ලුම්කරු ද ඉල්ලුම්කරුගේ නියෝජිත ද විනය පරීක්ෂණය පැවැත් වූ ආකාරය සතුටුදායක බව සඳහන් කරමින් අත්සන් තබා ඇත. එසේ අත්සන් තබා පසුව විනය පරීක්ෂණය නිසි පරිදි නොපැවැත් වූ බව ප්‍රකාශ කිරීම කිසිසේත් පිළිගත නොහැක.

දෙපාර්ශ්වය අතර ආරාවුලට හේතු වී ඇති අනෙක් කරුණ වන්නේ විනය පරීක්ෂණ නියෝගය මගින් ඉල්ලුම්කරුට අසාධාරණයක් වී තිබේද යන්නයි. ඉල්ලුම්කරුට එරෙහිව එල්ල කරන ලද චෝදනා සියල්ල ඔප්පු වී ඇති බව විනය නියෝගයේ සඳහන්ව ඇත. එම චෝදනා විනය ව්‍යවස්ථා මාලාවේ බරපතල විෂමාචාර ක්‍රියාවන් යටතට වැටෙන චෝදනාය. ඉල්ලුම්කරු 2006 වසරේදී ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂකවරයෙකුට අසභ්‍ය වචනයෙන් බැන වැදී තර්ජනය කිරීමේ චෝදනාව යටතේ චෝදානා පත්‍රයක් ඉදිරිපත් කර විනය පරීක්ෂණයේදී වරදකරු වී මසක කාලයක් සේවය තහනම් කරන ලද බව දෙවන පාර්ශ්වය පෙන්වා දී ඇත. එසේම 2014 වසරේද ඉල්ලුම්කරු එවැනිම චෝදනාවලට වරදකරු වී ඇත. ඒ අනුව මෙම විනය විභාගයේදී වරදකරු වීමෙන් පසු නියම කරන ලද දඬුවම (R3 ) යුක්ති සහගත බව පෙනී යයි. එම දඬුවමින් පසු ඉල්ලුම්කරු කරන ලද අභියාචනය විභාග කර එම දඬුවම අඩු කිරීමක්ද සිදු කර ඇත.

ඒ අනුව 2014.07.21 වැනි දින ඇති වී ඇති සිදු වීමකට අදාළව ඉල්ලුම්කරු වන ඩී. එන්. වන්නිආරච්චි මයා සම්බන්ධයෙන් පවත්වා ඇති විනය පරීක්ෂණය සාධාරණ හා යුක්ති සහගත අයුරින් පවත්වා ඇති බවත්, එකී විනය පරීක්ෂණ නියෝගය මගින් ඒ මහතාට අසාධාරණයක් සිදු වී නොමැති බවත් තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි. මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද ප්‍රකාශ කරමි.

බේරුම්කරු.

2023.02.03

EOG 03-0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.